# උපකාරකස්මෘති

"ළමා මන්දපෝෂණය කෙරෙහි දරිද්‍රතාවේ බලපෑම (කළුතර දිස්ත්‍රික්කයේ පෙර පාසල් ඇසුරින්)" යන අධ්‍යයන මාතෘකාව ඔස්සේ සැකසුන මෙම පර්යේෂණ නිබන්ධය වසර කිහිපයක (වසර 06 ක පමණ) ශාස්ත්‍රීය වෙහෙසක ප්‍රතිඵලයකි. මෙම කාර්යයට අධ්‍යයනික මාර්ගෝපදේශකත්වය සපයනු ලැබුවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය පී. විල්සන් මහතා සහ රුහුණ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පියසිරි විතානගේ යන මහත්මාවරුන් ය. දරිද්‍රතාව සහ මන්දපෝෂණය පිළිබඳ උපදෙස් ලබාදෙමින් ආරම්භයේ සිටම එතුමන්ලාගෙන් මා වෙත ලැබුණු සහාය ප්‍රශංසාත්මකව මෙහිදී පළමුව සඳහන් කළ යුතුය. එසේම එතුමන් දෙපළ විසින් පශ්චාත් උපාධි අධ්‍යයනයක නියැලෙන පර්යේෂකයෙකුට අවශ්‍ය මඟපෙන්වීම නිසි ලෙස ලබාදීම සාර්ථකව නිබන්ධනය නිම කිරීමට හේතුව විය.

මෙම අධ්‍යයනයට අවශ්‍ය වූ ඇතැම් පරිශීලනයන් ලබා දීමෙන් උදව් කළ ආයතන කිහිපයක් මෙහිදී ස්තුති පූර්වකව සඳහන් කිරීම මාගේ යුතුකමකි. කළුතර සෞඛ්‍ය විද්‍යායතනය, කොළඹ සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව, සමෘද්ධි අධිකාරිය, ක්‍රම සහ සැළසුම් සම්පාදන අමාත්‍යාංශය, කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර පෙර පාසල් පදනම, කළුතර නගර සභාව, අගලවත්ත ප්‍රාදේශීය සභාව, පාලින්දනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යනාදිය එම ආයතන වේ.

මෙම ශාස්ත්‍රීය කටයුත්ත සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ මහාචාර්ය මොරිසන් පෙරේරා මහතා, ජයන්ත ජයසිරි මහතා යන සහෝදර ආචාර්ය දෙපළ, රුහුණ විශ්වවිද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය සරත් අමරසිංහ මහතා සහ ආර්ථික විද්‍යා අධ්‍යයනාංශයේ බී.එම්. සුමනරත්න, ජ්.ජේ.එම්. චන්ද්‍රදාස, අයි.ඊ. ලේල්වල, ඩබ්.අයි.සී.එස්. ගුණසිංහ යන ආචාර්යවරුන්ගේ දිරිමත් කිරීම මෙහිදී මතක් කළ යුතුය.

විටෙක බාධා කරමින්, තවත් වරෙක විඩාව නිවමින් මා සැනසූ දඟකාර වයසේ කෙළිදෙලෙන් පසුවන ඩබ්.ඒ. දම්සර සත්‍යාංග, මධුසර මෙත්තාංග සහ රන්සර මුදිතාංග වන ම පුතනුවන් ද, අවශ්‍ය කාලය සහ මඟ පෙන්වීම ලබා දෙමින් නිරතුරුව මා දිරිමත් කළ ආදරණීය ස්වාමි පුරුෂයාණන් වන ඩබ්.ඒ. ධම්මික රාජපක්ෂ මහතාගේ ආදරය, කරුණාව සහ උපේක්ෂාව ද මෙම පර්යේෂණ නිබන්ධනයේ සාර්ථකත්වයට හේතු විය.

කළුතර නගර සභා බල ප්‍රදේශයේ සහ අගලවත්ත ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නියැදියෙන් ක්ෂේත්‍රයීය දත්ත රැස් කිරීමේ කාර්යය ඉතාමත් හොඳින් සිදුකර ගැනීමට උදව් කළ පර්යේෂක සහායිකාවන්ට, පෙර පාසල් පාලිකාවන්ට, පෙර පාසල් දරුවන්ට, ඔවුන්ගේ දෙමාපියන්ට, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන්ට ස්තුතිය පුද කරමි. ඒ වාගේම මා විසින් ලියන ලද අත් පිටපත උනන්දුවෙන්, මනා ශික්ෂණයකින් හා අවබෝධයකින් යුතුව කියවා පරිගණක අක්ෂරගත කළ අනුපමා මහත්මිය සහ අචින්ත මහතා ගත් උත්සාහය නිසා මෙම නිබන්ධනයේ නිමාව අලංකාර විය.